**ඉපලෝගම ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 24 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සභාව සතු වාහනවල එකතු වටිනාකම රු.1,800,000 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව වූ රු. 87,257,651 ක්වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය/සත්‍යක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 772,974 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,652,111 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1988 ප්‍රාදේශිය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති අංක 99 හි විධිවිධාන වලට පටහැනිව එකතුව රු.4,862,673 ක්වූ ගෙවීම් වවුචර් 79 ක් සඳහා සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි.

(ආ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 237 (අ) සහ (ආ) ප්‍රකාරව, ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී අදාල භාණ්ඩ, ගිවිසුම් ප්‍රකාරව නියමිත ගුණත්වයෙන් ගබඩාවට ලැබුණු බවට ගබඩා භාර නිලධාරියා විසින් සහතිකයක් දිය යුතු වුවත්, අවස්ථා 11 කදී එකතුව රු. 161,775 ක්වූ ගබඩා සැපයීම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | වරිපනම් බදු | 532 | 371 | 161 |
| (ii). | බදු කුලී | 2,000 | 1,554 | 447 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 590 | 561 | - |
| (iv). | වෙනත් ආදායම් | 9,671 | 10,280 | 406 |

### 2.3.2 බදුකුලී

සභාවට අයත් කඩකාමර 70 ක් සඳහා තක්සේරු කරන ලද මුදල අය කිරීමට කටයුතු නොකිරීම නිසා රු.1,513,800 ක බදුකුලී ආදායමක් අහිමි වී තිබුණි.

### 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු |
|---|---|---|
| (i). | උසාවි දඩ | 1,084,697 |
| (ii). | මුද්දර ගාස්තු | 1,935,570 |

**2.4** නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

-----------------------------------------------------

උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2008 වර්ෂයේදි ලබා දී තිබුණු වටිනාකම රු.776,500 ක්වූ සහල් පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන උපකරණ ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

**2.5** **කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------------

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(i) ඡේදයේ විධිවිධාන වලට පටහැනිව කොන්ත්‍රාත් සඳහා සියයට 20 ක සීමාව ඉක්මවා රු.150,000 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි.

**2.6** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------------------------

(අ). සභාවට අයත් කඩ කාමර 03 ක් පදිංචිය සඳහා නිවාස ලෙස භාවිතා කරමින් පැවැතුන අතර කඩ කාමර 10 ක් අතුරු බදු දීම් කර තිබුණි. තවත් කඩ කාමර 08 ක් ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබුණි.

(ආ). ඉදිරි වර්ෂවල ක්‍රියාකාරිත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.** **පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අභ්‍යන්තර විගණනය

(ඇ) ආදායම් පරිපාලනය